සුබසිංහ මහතා මුවෙන් නොබැණ පැත්තකට සිනාසුණේ ය. පක්ෂයේ ඇමති කෙනකු වුවද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිතිවලට විශේෂ අනුග්‍රහය නොදැක්වීම ගැන ඔහුට චෝදනා ද එල්ල විය. හොඳම නිදසුන සහිත සාකච්ඡාවක වාර්තාව සකස් කළේ මම ය. ඇමතිතුමාට පමණක් නොව, පක්ෂයේ පතාක යෝධයකු වූ සභාපතිට ද චෝදනා එල්ල වී තිබුණි. එම සභාපති ඊ.ආර්.එස්.ආර්. කුමාරස්වාමිය. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශ්‍රී ලංකා වෘත්තීය සමිතිවලට කුඩම්මාගේ සැලකිල්ල දක්වන බව සඳහන් ලිපියක් පක්ෂයේ ලේකම් කේ.බී.රාජපක්ෂ මහතාගෙන් ඇමතිතුමාට ලැබුණේ ය. චෝදනාවට පදනම් වූ පසුබිම ද රහසක් නොවේ. බොහෝ නිලධාරීන්ට හිසරදයක් වූ සරත් නවාන සහ සභාපති අතර පැවතියේ පුදුමාකාර සබඳතාවකි. මේ දෙන්නා අහසට පොළොව මෙන් යයි මා සිතුව ද කට සැර පුද්ගලයකු වුව ද උගත් බුද්ධිමතකු වූ සරත් නවාන නීතිවේදියෙකු වූ කුමාරස්වාමි සමඟ කාර්මික ප්‍රශ්න ගැන හේතු සාදක මත සාකච්ඡා කිරීමට සමත් වී යයි සිතමි. ඔහු ලංකා තෙල් කම්කරු සංගමයේ ලේකම් ය.

යට කී පැමිණිල්ලෙන් පසුව සභාපති සහ ශ්‍රී ලංකා වෘත්තිය සමිති නියෝජිතයන් කැඳවා කළ එම සාකච්ඡාව අමතක නොවන්නකි. සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද වෘත්තීය සමිති නියෝජිතයා ද එයට සහභාගි විය. අවසානයේ දී තීරණය වූයේ සියලුම වෘත්තීය සමිතිවලට එක සේ සාධාරණව සැලකිය යුතු බව ය. එම තීරණය අවධාරණය කරමින් සභාපතිවරයා කළ ප්‍රකාශය තරවටුවක් ද වී යයි සිතිමි.

''මින් මත්තට කිසි කෙනකුට විශේෂ සැලකිල්ලක් නො දක්වා මම ක්‍රියා කරනවා''

එය එල්ල වූයේ විශේෂ සැලකිලි ඉල්ලා සිටියවුන්ට ය.

ඇමතිතුමා කරන පත්වීම් ගැන ප්‍රශ්න කරන්නෝ ද ඉඳහිට දකින්නට ලැබුණ හ. ඛනිජ වැලි සංස්ථාවේ වෘත්තීය සමිතියක නියෝජිත පිරිසේ නිලධාරියකු වූ අසෝක වීරසූරිය මතු කළ ප්‍රශ්නය එබන්දකි.

''මම ඔබතුමාගෙන් අහන්නේ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන්න යම්කිසි අධ්‍යාපන සුසුදුකමක් තියෙනව ද කියල''

ප්‍රශ්නයේ එල්ලය රහසක් නොවී ය. හරිහමන් අධ්‍යාපනයක් නොලත් පුද්ගලයකු පුල්මුඩේ ප්‍රදේශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කොට තිබුණි. ඇමතිතුමා ප්‍රශ්නය මඟ හැරියේ නැත.

''අසෝක, මතක තියා ගන්න. ගමනක් යන්න පිටත් වුණාම මඟදි පැසෙන්ජර්ලත් ගන්න සිද්ද වෙනවා''

සදාහරිත සභාපති ගණයට අයත් තංගරාජා මහතා මුලින්ම කඩදාසි සංස්ථා සභාපති ධුරයට පත් කළේ පිලිප් ගුණවර්ධන ඇමතිවරයා ය. හැම පක්ෂයකම නායකයෝ ඔහුගේ කාර්යක්ෂමතාව සහ අවංකභාවය ගැන පැහිදී සිටියහ. එසේ වුව ද සමසමාජ පක්ෂයට අනුබද්ධ එක්සත් වෙළෙඳ හා වාණිජ සංගමයේ සංස්ථා ශාඛාව ඔහු සමඟ ගැටුණේ ය. ගැටුමේ උච්චාවස්ථාව වූයේ උපවාසයකි. සංගමයේ නායකයා සිය සගයකු ද සමඟ උපවාසය පටන් ගත්තේ අමාත්‍යාංශයේ රිය නවත්වන මඩුව තුළ ය. නායකයා ආනන්දයේ මගේ ගෝලයකු වූ සෝමසිරි හේරත් ය. විද්‍යාලයේ විවාද කණ්ඩායමේ සාමාජිකයකු වූ ඔහු දක්ෂ කථිකයෙක් ද විය. කාර්යාලයට යන එන දෙවේලේ ම ඔහු වෙත ගොස් වචනයක් දෙකක් දොඩනවා හැරෙන්නට මම මේ අරගලයට මැදිහත් වන්නට නො සිතුවෙමි. දින තුන හතරක් ගිය තැන ඇමතිතුමාගේ පුද්ගලික ලේකම් පී.ඒ. කරුණාරත්න මා ඇමතුවේ සවස ගෙදර යන්නට සූදානම් වන විට ය.

''මේක දිගට යන්න දෙන්න බැහැ. අපි මොනවා හරි කරන්න ඕනැ''

මෙසේ කියමින් මාත් ඇදගෙන ඇමතිතුමාගේ කාමරයට ගියේ ය. කතා කළේ ඔහුම ය. මම හූමිටි තැබුවෙමි. ඇමතිතුමා උපවාසකාරයන් දෙදෙනා කැඳවා සාකච්ඡා කරන්නට එකඟ විය. සාකච්ඡාව අවසන් වූයේ සමිතිය නගන චෝදනා විභාග කිරීමට පරීක්ෂණ කමිටුවක් පත් කිරීමට ඇමතිතුමා පොරොන්දු වීමෙනි. කමිටු සභාපතිකමට ඇමතිතුමා තේරා ගත් ආචාර්ය කේ. ඩබ්ලිව්. අලගියවැන්න එක්වරම ඇරැයුම පිලිගත්තේය. පරන්තන් රසායන ද්‍රව්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වූ ගණකාධිකාරි සංගක්කාර සහ නීතිඥයෙක් අනෙක් සාමාජිකයෝ වූහ. කමිටුවෙන් ප්‍රයෝජනයක් ලැබුවේ ලේකම් වශයෙන් කටයුතු කළ කාර්මික සංවර්ධන මණ්ඩලයේ බිමල් පද්මපෙරුම පමණි, ඔහුට සංස්ථා සාමාන්‍යාධිකාරි තනතුර ලැබුණේ ය. කමිටු නිගමනය ඒකමතික නොවුව ද, එය ඇමතිතුමා අපේක්ෂා කල ප්‍රතිපලය යැයි සිතමි. සංස්ථා සභාපති අත වරදක් නැති බව සොයා ගනු ලැබීය. සෝමසිරි හේරත්ට ද හිරිහැරයක් වූයේ නැත. වසර ගණනාවකට පසු අන්තිම වතාවට මට හමුවන විට සෝමසිරි ජාත්‍යන්තර ආයතනයක වගකිවයුතු තනතුරක් දරමින් සිටියේ ය.

ජාතික සේවක සංගමයට අමාත්‍යාංශයේ තැනක් ලැබුණේ නැති තරම් ය. මගේ මට්ටමෙන් ඉහළ කිසිදු නිලධාරියකු මුණ ගැහෙන්නටවත් ඔවුනට අවසර නැත. ජාතික සේවක සංගමයේ ප්‍රබල නායකයකුගේ මුලිකත්වයෙන් පැමිණි තුනීලෑලි සංස්ථාවේ සමිති නියෝජිත පිරිසක් සමඟ දීර්ඝ සාකච්ඡාවක යෙදෙන්නට මට සිදු වූයේ ඒ නිසා ය. මම ඔවුන්ට හැකිතරම් හොඳින් සලකා සාවධානව සවන් දුන්නෙමි. එම වෘත්තීය සමිති නායකයා කලකට පසු ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව ආයතනයේ දී හමුවන විට ඔහු උඩු පිලේ බලවතෙක් විය. ඔහුගේ කෘතවේදීභාවය ප්‍රකාශ වූයේ එහිදී ය.

රජයට අයත් පක්ෂ තුනේ ම වෘත්තීය සමිති නායකයන් සමඟ සුහද සබඳතාවක් ඇති කර ගැනීමට මම සමත් වීමි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආනන්ද දසනායක පමණි මා කලින් දැන සිටියේ, ප්‍රසන්න පුද්ගලයකු වූ අලෙවි මවුලානා හමු වූයේ එහිදී ය. ඔහුගේ සහායට කාර්යශූර තරුණ නිලධාරියෙක් ද විය. කොමියුනිස්ට් සමිති නායකයන් වූ ඉන්දික ගුණවර්ධන සහ එල්.ඩබ්ලිව්. පණ්ඩිත වරින් වර මුණ ගැසුණ ද සබඳතාව එතරම් සමීප වූයේ නැත. සමසමාජ පක්ෂයේ ඩී.ජී. විලියම්, බැටී වීරකෝන් සහ පර්සි වික්‍රමසේකර සමඟ ගොඩ නැඟුණේ හිතකර සබඳතාවකි. එම පක්ෂයේ ම සරත් නවාන එහි පැමිණියේ කලාතුරකිනි, ඇමතිතුමා සමඟ වුවත් ගැටෙන්නට සමත් පුද්ගලයකු වූ ඔහු චාර්ල්ස් අබයසේකරට කීවේ චේතිය රජ්ජුරුවන් කියා ය. බොරු පොරොන්දු දෙන නිසා ය. නැහැ-බැහැ කියන්නට බැරිකම නිසා බැරි පොරොන්දු වීමේ දුබලතාව ඔහුගේ ලක්ෂණයක් විය. මේ නිසා ම චාර්ල්ස් අබයසේකරගේ වරදට මන්ත්‍රීවරුන්ගෙන් දොස් අසන්නට සිදු වූයේ ඇමතිතුමාට ය.

සරත් නවාන මා සමඟ ගැටුණේ නැත. මා සිටි අවදියේ ආනන්දයේ ශිෂ්‍යයකුව සිටීම ද එයට හේතුවී යයි සිතමි. ඔහු පුදුම සහගත පුද්ගලයෙකැයි සිතමි. රෝගාතුර වූ ඔහු මරණාසන්නව සිටියදී වූ දෙයක් මා අසා ඇත. එබඳු රෝගීන් වෙත ගොස් දේවාශිර්වාදය ලබා දෙන්නට සිතූ පූජකවරයෙක් සරත්ගේ කාමරයට කර පෙවීය.

''දරුවා ! ඔබ වෙනුවෙන් මොකක් ද මගෙන් කෙරෙන්න ඕනැ ?''

ගත දුබල වුවත්, කට පණ තිබුණේ ය. සරත් පිළිතුරු දුන්නේ සුපුරුදු වාංමාලාවෙනි.

''මෙතනින් තොලොංජි වෙලා ගිහින් ලස්සන කන්‍යා සොහොයුරියන් දෙන්නෙක් එවන්න''

ඉංගිරිසියෙන් පැවැත්වුණු සංවාදය සරත්ගේ චිත්ත ප්‍රීතිය පළ කරන අයුරු මගේ සිංහලෙන් දිය හැක්කේ එසේ ය.

සරත් මිය ගිය පසු ද නිලධාරීන් බිය වද්දන්නට සමත් වූ අවස්තාවක් ගැන මා අසා ඇත. නමින් තරමක් සමාන පුද්ගලයෙක් තමා හොඳින් දන්නා දෙපාර්තමේන්තු ප්‍රධානියකු හමුවන්නට ගියේ ය. ප්‍රධානියා කාන්තාවකි. ඇගේ කාමරය ළඟ සිටි කාර්යාල කාර්ය සහායකයාට තමාගේ නම කී අමුත්තා ඇතුළට කැඳවන තෙක් වාඩි වී බලා සිටියේ ය. පැය භාගයක් පමණ ගත වුව ද වරින් වර කර පොවා බලන ලිපිකාරියක හැරෙන්නට ඔහු කැඳවන්නට ආ කෙනෙක් නැත. බැරිම තැන ඔහු අනවසරෙයන් ම නිලධාරියාගේ කාමරයට පිවිසියේ ය.

''අනේ ! ඔයා ද ? මං හිතුවෙ සරත් නවාන කියල''

ඒ නිසාය ඇතුළට කැඳවීම පමා කළේ, අමුත්තා සරත් නාරංගල ය.

දිවංගත ඩී.බී.කුරුප්පු

For all your Advertising needs
mihirie@pahana.com.au
Mihirie Dissanayake
0414 546 833